ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

CEYLON GOVERNMENT GAZETTE No. 6,779 — FEBRUARY 25, 1916.

# SINHALESE TRANSLATIONS OF NOTIFICATIONS.

[By-laws made by the Local Board of Moratuwa relating to Wells.]

ලින් සම්බන්ධ අතිරේක ව්‍යවස්ථා.

1. ලෝකල්බෝඩ් සභාවක් පිහිටාතිබෙන නගරයක සීමාවතුළ යමෙකු විසින් ලිඳක් කැණවීම හෝ කැණීමට මාසයකට ප්‍රථම එම සභාවේ සභාපතිතැනට නොදන්වා හෝ එම සභාපතිතැනගෙන් ඊට අවසර පත්‍රයක් නොලබා ලිඳක් කැණවීම හෝ කැණීම නොකළ යුතුයි.

2. අගල්වල කුණු එකතුකරන වළවල් සහ වෙනත් කුණු වළවල්, ඌරුකොරටු, ගාල්, හරක්මඩු, පෝරගොඩවල්, දිය උරාබසිනඅගල්, අත්හැරදූ කක්කුස්සි, කුණුවීගිය එලවළුගොඩවල්, ගොමගොඩවල් සහ පෝරකරනලද ඉඩම් ආදියෙන් අඩි 50කින් අඩු දුර ප්‍රමාණයක ලින් කැණවීමට කිසිවෙකුට අවසර නොමැතිය.

3. බීමට සහ මනුෂ්‍යයින්ගේ වෙනත් ප්‍රයෝජනවලට වතුරගන්නා ලින්වලින් අඩි 50කට අඩු දුර ප්‍රමාණයක කාණුවල කුණු දැමීම පිණිස වළවල්, කක්කුස්සි, ඌරුකොටු, ගාල්, හරක්මඩු ආදිය සෑදීමද කුණුවගිය එලවළු සහ මළකුණු ආදිය වැළලීමද, පෝරජාති දමා ගොයිතැන්කිරීමද දිය උරාබසින අගල් තිබෙන්ට හැරීමද තහනම්වේ.

4. සියළුම ලිංවල ජලමට්ටම දක්වා සිමෙන්ති වැලිමැටි ආදී පදලමකින් බදිනලද ගඩොල් බැම්මක් හෝ යකඩ රෝල් නොහොත් සිමෙන්ති වැලිමැටි ආදි බැම්වලින් නැතහොත් වෙනත් සුදුසු ආකාරයකින් ලිඳතුළ වටේ ආරක්ෂාකොට ලිඳ පතුලෙන් හැර අන්‍ය ස්ථානවලින් වතුර ඉනීමට ඉඩ නොතිබිය යුතුයි.

5. ලිඳ මතුපිට එක භාගයක අඩු වශයෙන් අඩි 2කුත් අඟල් 6ක් පමණ උස ඇති තාප්පයක් බැන්ද යුතුයි. අනිත් භාගයේ වතුර අදින අයවළුන්ට සිටීමට ශක්තිමත් සුදුසු පඩියක් දැමියයුතුයි. එම පඩිය ලිඳපිට වටේ සාදා තිබෙන 6වෙනි වගන්තියේ සඳහන්වන බැම්මට ලිඳ කටේ සිට පිටපැත්තට වතුර ගලාබසින අන්දමේ හැඩේට සහ ලිඳ ඇතුළට වතුර උරා නොබසින අන්දමටද එම පඩියේ ලිඳ දෙපැත්තේ මතුපිට අඟල් 6ක් උස බැම්මක් කෙරවල්දෙක ඉහතකී තාප්පයේ කෙරවල් දෙකට එකතුවන අන්දමට සෑදිය යුතුයි.

6. ලිඳවටේ පොළව මතුපිට අඩි 5ක් පළලට සහ පිටතට වතුර බැසයන අන්දමට හැඩ ඇතිව ගලින් හෝ ගඩොලින් බැම්මක් බැඳ සිමෙන්ති දැමිය යුතුයි.

7. ලිඳ වටේ බදින එම බැම්මේ පිට කෙළවර වටේට සිමෙන්තියෙන් බදිනලද දිග අගලක්ද, ලිඳට කිට්ටුව වතුර නොසිටින ආකාර එම අගලේ දෙකෙළවරෙන් වතුර බැස ගලායාමට අඩි 10ක් පමණ දිග ඇති සිමෙන්තියෙන් බදිනලද දිය අගලක්ද ඇතිවිය යුතුයි.

8. වතුර ගැනීම පිණිස සිටීමට හෝ වෙන කිසි කරුනක් ගැන ලිඳ මතුපිට ලෑලි ආදියක් නොදැමිය යුතුයි.

9. ලිංවලින් වතුරගැනීමට ඒව සුදුසු පිරිසිදු භාජන පාවිච්චිකළ යුතුයි.

10. මනුෂ්‍යයින්ට බීමට හෝ වෙනත් ප්‍රයෝනවලට වතුර ගන්නා ලිඳක ලිං කටේ සිට අඩි 20කින් අඩු දුර ප්‍රමාණයක රෙදි ආදිය සේදීම නොකළ යුතුයි.

11. ප්‍රසිද්ධ නාන බාල්දි ලිං අයිතිකාරයා හෝ බදුකාරයා විසින් මිනිසුන්ට නෑමට බාල්දි සම්පාදනයකළ යුතුයි නාමින් සිටින කිසිවෙකු විසින් එම ලින්වලින් වතුර ඇදීම තහනම්ය.

12. ලිංවලට ගෙඩි සහ කොල වැටෙනාකාරයට යම් ගහක් හෝ ගහක අතු ලිඳට උඩින් තිබේනම් එම කොල සහ ගෙඩි ආදිය වැටීමෙන් හෝ වෙන අන්දමකින් එකී ලිංවල වතුර නරක්වීමට හේතුවන බව ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන හෝ අන්‍ය මහතෙක් විසින් විභාගකොට එම ගස් තිබෙන ඉඩම් අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් බාරකාරයාට එම ගස් හෝ අතු කැප්පවීමට නියමකොට ලියනලද දැන්වීමක් යැවිය යුතුයි. එම දැන්වීම යැවූ 14 දවසෙන් මෙපිට, ඒ අණ පිළිනොපැද්දේනම් ඔහු වැරදිකාරයෙක් ලෙස සලකනු ලැබේ.

13. බීමට හෝ වෙනත් ප්‍රයෝජනවලට වතුර ගන්නා යම් ලිඳක වතුර ඉස්සවා ශුද්ධකළ යුතු බව ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට වැටහේනම් එසේ කිරීමටූ නියමකොට ලියනලද ආඥාවක් එම ලිඳ පිහිටි ඉඩම අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් බාරකාරයාට ලියා එවිය යුතුයි. එම ආඥාව යැවූ 14 දවසෙන් මෙපිට එම අණ පිළිනොපැද්දේනම් ඔහු වැරදිකාරයෙක් ලෙස සලකනු ලැබේ.

14. සනීපාරක්ෂාව පිණිස එම සභාවේ අදහස පරිදි යම් ලිඳක් වැසීමට හෝ ලෙඩ වැලැක්වීම පිණිස ශුද්ධකිරීමට යෝග්‍ය බව සිරවුවහොත් එවැනි ලිං පිහිටි ඉඩම් අයිතිකාරයාට නොහොත් බදුකාරයාට හෝ බාරකාරයාට එසේ කිරීමට අණකොට ලියනලද ආඥාවක් යැවිය යුතුයි. එම ආඥාව යවූ අට දවසකින් ප්‍රථම ඒ අණ පිළිනොපැද්දේනම් ඔහු වැරදිකාරයෙක් ලෙස සලකනු ලැබේ.

15. ලිං කැණවීමට අදහස්කරනලද හෝ ලකුණුකරනලද ඉඩම් නොහොත් වෙනත් ලිං, ලිං පිහිටි ඉඩම් සහ අවට පිහිටි ඉඩම්ද පරීක්ෂාකර බැලීමට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් දෙනු ලැබූ ලියනලද බලකඩදාසියක්ලත් එම සභාවේ සුපරින්ටැන්ඩන්ට්තැන හෝ ඉන්ස්පැක්ටර් කෙනෙක් නොහොත් අන්කිසි මහතෙකුට බලය තිබේ.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 22වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඈස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වමහ.

[By-laws made by the Local Board of Ratnapura relating to Dairymen.]

වර්ෂ 1898වෙනි අවුරුද්දේ නොම්මර 13වෙනි ආඥාපනතේ 56වෙනි වගන්තියේ (5) සහ 21 උප වගන්තිවල ප්‍රකාර රත්නපුරේ ලෝකල්බෝඩ් සභාව විසින් සාදනලද පහත සඳහන්වන අතුරු පනත් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ කැමැත්ත පිට ස්ථිරකරනලද බව මෙයින් දැනගතයුතුයි.

ලංකාණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අණපරිද්දෙන්,
ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 22වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඉහත සඳහන්කළ අතුරුපනත්.

1. ලෝකල්බෝඩ් සභාවේ සීමාව ඇතුළත කිරි විකුණන්නාවූ සියළුම පට්ටිකාරයෝ ඔවුන්ගේ නම් සහ පදිංචි ස්ථානද, ඔවුන්ගේ වැඩකරුවන්ගේ නම් සහ පදිංචි ස්ථානද, ලෝකල්බෝඩ් සභාවේ කන්තෝරුවෙන් ලියවිල්ලකින් ඉල්ලා ලියාපදිංචි නොකර කිරි විකුණන්නාවූ හෙවත් විකිණීම පිණිස තබාගන සිටින්නාවූ යම් කෙනෙක් වැරදිකාරයෙක් වෙනවා ඇත.

2. වැසිකිළියක් හෝ කක්කුස්සි වළකට යාර 50ක් මෙපිට හෝ වැසිකිළියකින් හමන්නාවූ දුගඳ ඇති ස්ථානයක කිරිපට්ටියක් තබාගැනීමට තහනම්ය.

3. ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැනට සතුටුදායක පරිද්දෙන් කිරිපට්ටි ඇති ස්ථානවල සෑම මිදුල්වලට කාණු තිබෙන්ට ඕනෑවාත්හැර එම කානු නොකඩවම සෝදා පිරිසිදුව තැබියයුතුයි. කිරිපට්ටියක් ඇති ස්ථානවල මිදුලක පල්වතුර තිබෙන්ට ඉඩදෙනු නොලැබේ.

4. කිරි පට්ටියක හෝ ඒ අවට ඇති කුණු කසල අප්‍රමාදව අහක්කළ යුතුයි. දවස්පතාම පට්ටියෙන් ගොම අරන් දමන්නට ඕනෑය.

5. කිරිපට්ටියට නුදුරුවූ තැනක පිරිසිදු ජලාශයක් තිබෙන්ට ඕනෑය. කිරිපට්ටියේ මිදුලක තිබෙන ළිඳක නාන්ට හෝ රෙදි සෝදන්ට ඉඩදෙනු නොලැබේ.

6. කිරි පට්ටියක් වශයෙන් පාවිච්චිකරනලද ගොඩනැගිල්ලක් මනුෂ්‍යවාසයට හෝ වෙන කිසියම් දෙයකට පාවිච්චි කළයුතු නොවේ. නිරතුරුම එවැනි ගොඩනැගිලි පිරිසිදුව තබාගත යුතුයි.

7. කිරි එළදෙනුන්ට කිසිම ලෙඩක් නැතුව සිටින්ට ඕනෑය. තවද පට්ටිකාරයෝ බෝවෙන වසංගත රෝගවලින් තොරව සිටිය යුතුයි.

8. කිරි පට්ටියක පාවිච්චිකරණ හෝ ඊට අයත් භාජන ලීබඩු ආදි වෙනත් වුවමනා උපකරණ පිරිසිදුව තබාගත යුතුයි.

9. කිරි ගෙනියන්නාවූ භාජනවලට නිසි පියන්පතක් තිබෙන්ට ඕනෑය. නැතහොත් ඒවා කිරි උරානොගන්නාවූ යමකින් වසාගනයන්ට ඕනෑය. එපමණකුත් නොව ඒවා කිහිල්ලේ තබාගන ගෙනියන්ට තහනම්ය.

10. වතුර හෝ වෙන කිසි යමක් දමා බාලකරණලද කිරි විකිණීම හෝ විකිණීමට තබාගන සිටීම හෝ විකුණන්ට ගෙනයෑම නීතියට විරුඬය.

11. කිරිවල යොදේ අහක්කර තිබෙනවායයි කිරි මිලේට ගන්නාවූ තැනැත්තාට පළමුකොට නොදන්නවා කිසිවෙක් විසින් යොදේ අහක්කරණලද කිරි විකුණන්ට හෝ විකිණීම පිණිස දෙන්ට යුතුනැත.

12. ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැන හෝ පලාතේ දොස්තර මහත්මයා හෝ ඔහුගේ දෙවෙනියා හෝ නැතහොත් ලෝකල්බෝඩ් සභාවේ ඉන්ස්පැක්ටර් කෙනෙක් කිරි විකුණනන්නාවූ හෙවත් විකිණීම පිණිස ගෙනියන්නාවූ මිනිහෙකු ලඟ තිබෙන කිරි හෝ ලියාපදිංචිකර තිබෙන පට්ටියක කිරි කොයිම වේලාවකදී නමුත් පරීක්ෂාකර බැලීම පිණිස ඉල්ලුවිට දෙන්නට ඕනෑය. එසේ නොදෙන්නාවූ යමෙක් වැරදිකාරයෙක් වෙනවා ඇත.

13. පරීක්ෂාකර බලන පිණිස ගත් කිරක් නරක්කර තිබෙන බව ඔප්පුවුනිනම් යම් පට්ටිකාරයෙකුගෙන් හෝ ඔහුගේ වැඩකාරයෙකුගෙන් ඒ කිරි පරීක්ෂාකිරීමට ගන්ට යෙදුනාද ඔහු වැරදිකාරයෙක් හැටියට කල්පනාකරනු ලැබේ.

14. මේ ඉහතකී අතුරුපනත් කඩකිරීම කරණකොටගෙන ලියාපදිංචිකර තිබෙන පට්ටියක් අවලංගුකිරීමට ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැනට බලය තිබේ.

# LAND SALES.

## ඉඩම් විකිණීම්.

[Sale of the Lease of Crown Lands said to contain Plumbago, Galle District.]

ගාලු දිස්ත්‍රික්කේ මෙහි පහත සඳහන්වෙන මිනිරන් තිබෙනවාය කියා කල්පනාකර තිබෙන රජසන්තක ඉඩම්වල අවුරුදු පහකට මිනිරන් හෑරීමේ බද්ද ගාලු දිස්ත්‍රික්කේ ඒජන්ත උන්නාන්සේ විසින් ගාල්ලේ කච්චේරියේදී මෙහි පහත දක්වන කොන්දේසි පිට වර්ෂ 1916ක්වූ මැයි මස 9වෙනි අඟහරුවාදා පස්වරු 1ට ප්‍රසිඬ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත.

(*a*) එම බද්ද ආණ්ඩුවෙන් පණවනලද නියෝගවලට සහ කොන්දේසිවලටත් යටත්ව අවුරුදු පහකට අවුරුද්දකට අක්කරයකට රුපියල් 10 බැගින් බිම්බද්ද ගෙවන්ට ඕනෑවා පමණකුත් නොව අවුරුදු පහකට මිනිරන් හෑරීම පිණිස හතරවෙනි තීරයේ සඳහන්කර තිබෙන තක්සේරු මුදලට ඊට වඩා ඉල්ලුම්කාරයින්ගෙන් වැඩිඉල්ලුම්කාරයා ගැනුම්කාරයා වෙනවා ඇත. එකී කොන්දේසි පිටපතක් මේ කච්චේරියෙන් ලබාගන්ට පුළුවන.

(*b*) විකිණීම අවසානවුන වහාම වැඩි ඉල්ලුම්කාරයා කියනලද අය ඉල්ලුම්කළ මුදලෙන් සියයට දහයවන මුදලක් ඔහු ප්‍රථම යම් මුදලක් කච්චේරියේ තබා තිබුනා හෝ නොතිබුනා හෝ ඒජන්ත උන්නාන්සේට නොගෙව්වොත් හෝ ඉහත පෙනෙන විකිනීමේ කොන්දේසි අත්සන් නොකොළොත් ගැනුම්කාරයාට නොවන්නේය.

(*c*) ගැනුම්කාරයා විකුනාපු දින පටන් මාසයක් ඇතුළතදී ඉතුරු මුදල් ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට ඕනෑය. එසේ නොකොළොත් විකිනීම ස්ථිර නොවෙනවා පමණකුත් නොව ගෙවනලද සියයට දහයේ මුදලද ආණ්ඩුව සන්තක වෙනවා ඇත.

(*d*) නියමකර තිබෙන කාලය ඇතුළතදී එකී මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට යෙදුනොත් උන්නාන්සේ විසින් ගැනුම්කාරයාට නියම ෆෝර්මයේ බදු ඔප්පුවක් දෙන්ට යෙදෙනවා ඇත. ඔහු එවේලේම එයින් පිටපතක් ඒජන්ත උන්නාන්සේට දෙන්ට ඕනෑය.

(*e*) ඒ ඉඩම් විස්තර කෙරීමෙහි හෝ මැනීමෙහි යම් වැරැද්දක් පසුව දැනගන්ට ලැබුනා ඇද්ද ගැනුම්කාරයා විසින් ගත් මුදලෙන් අඩුකිරීමක් කරන්ට ආණ්ඩුව බැඳීනැත.

(*f*) බදු ඔප්පුව සෑදීමේ ගාස්තුව මිලේටගත් මුදලෙන් සියයට හතර බැගින් රුපියල් 20කට වැඩිනොවන ගණනක් වේ. එය විකිණීම දවසේදී ගෙවන්ට ඕනෑය.

බෙන්තර වලල්ලාවිටිකෝරළේ.

සිතියම 5,823. ගම—යටගල.

| නො. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. | අක්කරයක තක්සේරුව, රු. |
|---|---|---|---|
| 14268 | .. කරකැටියේකැලේ | 3 1 28 | 150 |

සිතියම 1,0079. ගම—මාගල උතුර.

| නො. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. | අක්කරයක තක්සේරුව, රු. |
|---|---|---|---|
| 4503 | .. පොල්හුන්නාකැලේ | 1 2 37 | 300 |
| 4505 | .. එම .. | 1 2 27 | 300 |
| 4506 | .. එම .. | 5 1 6 | 300 |
| 4507 | .. මිල්ලගහවත්ත .. | 0 2 2 | 300 |
| 4508 | .. එම .. | 0 2 0 | 300 |
| 4509 | .. පොල්හුන්නාකැලේ | 2 3 13 | 300 |

වැල්ලබඩපත්තුව.

සිතියම 9,527. ගම—බටපොල.

| නො. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. | අක්කරයක තක්සේරුව, රු. |
|---|---|---|---|
| 2431 | .. දෙළොස්හවුලේකැලේ මානාන .. | 3 3 13 | 200 |

ආර්. බී. හේන්,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 9වෙනි
දින ගල්ලේ කච්චේරියේදිය.

**No. 1,960, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ මාර්තු මස 29වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ හුරුළු සහ කලාගම් පලාතේ පිහිටාතිබෙන බිම් කැබලි 29ක්.

සිතියම 4,598. ගම—උඩ්ඩියන්දහනැකවැව. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 7 | හැලඹගහඉඩම .. | ඒ. කොලන්ද මරික්කාර් .. | වියට සුදුසු කැලේ .. | 2 0 37 | 20* |

සිතියම 4,622. ගම—මහපොතානමුකිරියාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 11 | හුරිගහඉඩම .. | ඇම්. ඇල්. මහම්මදු කාදර්ලෙබ්බේ සහ තවත් කෙනෙක් .. | වියට සුදුසු කැලේ .. | 1 3 14 | 19·60* |
| 12 | මීගහඉඩම .. | ඇම්. ඇල්. මහම්මදු කාදර්ලෙබ්බේ සහ තවත් කෙනෙක් .. | එම .. | 1 3 20 | 28·15* |

සිතියම 4,665. ගම—උඩ්ඩියන් පළුගොල්ලේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 2 | කොහොඹගහඉඩම .. | ඩබ්ලිව්. වී. වී. මල්හාමි මොහොට්ටාල | කැලේ .. | 1 3 29 | 19* |

සිතියම 4,679. ගම—කල්පේ හැදගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | තිඹිරිගහඉඩම .. | සී. ඇම්. පුංචිරාල කෝරාල ඊතල් වැටුණු වැවේ .. .. | වියට සුදුසු කැලේ .. | 1 0 32 | 15† |

සිතියම 4,722. ගම—නෑගම්පහකන්දේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | සියඹලාගහවත්ත .. | කේ බන්ඩා .. .. | සවදෙශිකවත්තට සුදුසු සිහින්කැලේ .. | 0 2 13 | 15† |
| 2 | මාරගහවත්ත .. | කේ. ඩිංගිරිබන්ඩා .. .. | එම .. | 0 3 0 | 15† |

සිතියම 4,761. ගම—නෑගම්පහකතරගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | දඹගහපිට්ටනිය .. | කේ. පී. ඩිංගිරියා .. .. | වියට සුදුසු හීන්කැලේ .. | 0 1 13 | 15 |

සිතියම 4,777. ගම—කිරලව ආඩියාගල.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | නෙත්තිපොලහේන .. | මාරසිංහ හම්මිල්ලවැවේ බී. ඇම්. කපුරුහාමි රිජිස්ත්‍රාර් සහ තවත් සතරදෙනක් | වියට සුදුසු මඩවගුර සහ හීන්කැලේ .. | 4 0 32 | 15 |
| 2 | එම .. | — .. .. | හීන්ඔයට ඉතිරිකර තිබෙන හරිය .. | 2 3 3 | — |

සිතියම 4,787. ගම—නෑගම්පහකෝරළේ හුණුපොළගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | දඹගහහේන .. | ආර්. උක්කුරාල වෙල්විදානේ .. | සවදෙශික වත්තට සුදුසු හීන්කැලේ .. | 1 2 14 | 15 |

සිතියම 4,791. ගම—උඩුරව ගල්කිරියාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | වත්තේගමකැලේ .. | ඊ. කළුබන්ඩා .. .. | වියට සුදුසු කැලේ .. | 2 0 7 | 15 |
| 2 | අක්කරවෙල .. | එම .. .. | ඊ. කළුබන්ඩා විසින් විසින් අල්ලාගත් හරිය .. | 1 2 17 | 25 |

සිතියම 4,796. ගම—මාමිනියාවෙරුන්කුලම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | වෙරුන්කුලමකැලේ .. | ඇල්. ඇල්. ඒ. කපුරාල උපාසකරාල .. | වියට සුදුසු කැලේ .. | 1 3 7 | 15 |
| 2 | මීගහපිල්ලෑව .. | කේ. කපුරුහාමි වෙල්විදානේ .. | පිට්ටනිය සහ තැනින්තැන පඳුරු සහිත ඉඩම .. | 0 3 28 | 15 |
| 3 | එම .. | එම .. .. | කේ. කපුරුහාමි වෙල්විදානේ විසින් අල්ලාගත් හරිය .. | 0 0 38 | 20 |

සිතියම 4,788. ගම—කිරලව තෙලදින්නන්වැව

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | අස්වැද්දුම්පිටිය .. | — .. .. | වැව්කන්දට ඉතිරිකර තිබෙන හරිය .. | 0 3 17 | — |
| 2 | ඇස්වැද්දුම්පිටිය .. | ජී. සිරියා .. .. | හීන්කැලේ .. | 1 3 29 | 15 |
| 3 | එම .. | — .. .. | අඩිපාරට ඉතිරිකරතිබෙන හරිය .. | 0 0 17 | — |
| 4 | එම .. | ජී. සිරියා .. .. | හීන්කැලේ .. | 3 0 25 | 15 |
| 5 | එම .. | — .. .. | අමුණුඇලට ඉතිරිකර තිබෙන හරිය .. | 0 2 5 | — |

* මේවා මීට පෙර ප්‍රසිඩකරනලදී. වර්ෂ 1915ක්වූ නොවැම්බ්‍ර මස 12වෙනි දින නොම්මර 6,754 දරණ ගැසට්පත්‍රය බලනු.

† මේවා මීට පෙර ප්‍රසිඩකරනලදී. වර්ෂ 1915ක්වූ නොවැම්බ්‍ර මස 26වෙනි දින නොම්මර 6,757 දරණ ගැසට්පත්‍රය බලනු.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහන. අ. | රූ. | ප. | අක්කරයක හ්‍යාක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | සිතියම 4,800. ගම—කිරලව මහඋරුලෑව. | | | | | |
| 1 | කුඹුක්ගහහේන | ඩබ්ලිව්. අප්පුහාමි | වියට සුදුසු මඩවගුර සහ හීන්කැලේ | 5 | 2 | 25 | 15 |
| 2 | එම | — | හැවනැල්ලේ ඔයට ඉතිරිකර තිබෙන හරිය | 2 | 0 | 32 | — |
| | | සිතියම 4,802. ගම—උඩුරවකුඩාහෙට්ටිගම. | | | | | |
| 1 | මැනික්ගලපන්සල | වනසිංහ විහාරේ සිඩාර්ත නායක හාමුදුරුවෝ | පොඩි ගෙයක් ඇති දූවුරුදු පමණ වැවිලි ඇති වත්ත | 0 | 2 | 17 | 20 |
| | | සිතියම 4,811. ගම—උඩුරුවදික්වන්නැව. | | | | | |
| 1 | විහේන්කොටුව | යූ. බී. අප්පු සහ තව කෙනෙක් | වියට සුදුසු කැලේ | 3 | 0 | 33 | 15 |
| | | සිතියම 4,812. ගම—උඩුරුව හම්මිල්ලෑව. | | | | | |
| 1 | වැල්පිල්ලෑව | ඩබ්ලිව්. ඇන්. කපුරුහාමි හිටපු ආරච්චිල සහ තව කෙනෙක් | වියට සුදුසු කැලේ | 2 | 3 | 6 | 15 |
| 2 | එම | — | පාරට ඉතුරුකර තිබෙන හරිය | 0 | 0 | 10 | — |
| | | සිතියම 4,816. ගම—උඩුරුවකෝරලේ දඹේවටවන. | | | | | |
| 1 | සේරුගහකැලේ | බී. වන්නිහාමි | වත්තට සුදුසු කැලේ | 1 | 1 | 33 | 15 |
| 2 | කෝන්ගහකැලේ | කේ. බී. කපුරල | එම | 1 | 3 | 0 | 15 |

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 15වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වම්හ.

---

**No. 1,186, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ මාර්තු මස 31වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බිරාදෙන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ වෙල්ලස්ස සහ උඩුකිඳ කොඨාසවල පිහිටාතිබෙන බිම්කැබලි 41ක්.

**අන්තිම සිතියම 138. ගම—වෙල්ලස්සේ මැදගම්පත්තුකෝරලේ බිබිලේමුල්ල. මෙම ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ.**

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහන. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2a | උඩගෙදරවත්තේහේන | ආණ්ඩුව | සිහින්කැලේ | 0 | 0 | 8 | —* |
| | | ඉල්ළුම්කාරයා—ලුනුගල ඇම්. ඒ. පීරිස් මහතා. | | | | | |
| 2b | එම | ආණ්ඩුව | සිහින්කැලේ | 0 | 2 | 5 | 25 |
| | | මෙම ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | |
| 2c | එම | ආණ්ඩුව | සිහින්කැලේ | 0 | 0 | 28 | —* |
| | | ඉල්ළුම්කාරයා—ඇම්. ඒ. පීරිස් මහතා. | | | | | |
| 2d | එම | ආණ්ඩුව | සිහින්කැලේ | 2 | 1 | 10 | 25 |
| | | මෙම ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | |
| 4a | ගොමගොඩලන්ද හෙවත් ගොමගොඩයාය | ආණ්ඩුව | සිහින්කැලේ | 0 | 1 | 36 | —* |
| | | ඉල්ළුම්කාරයා—ඇම්. ඒ. පීරිස් මහතා. | | | | | |
| 4b | එම | ආණ්ඩුව | තල්ගස් කීපයක් සහ බුරුතගස් කීපයක් ඇති සිහින්කැලේ | 37 | 3 | 11 | 25 |
| | | මෙම ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | |
| 4c | එම | ආණ්ඩුව | තල්ගස් කීපයක් ඇති සිහින්කැලේ | 0 | 1 | 14 | —* |
| 4d | එම | එම | සිහින්කැලේ | 1 | 0 | 34 | —* |
| 4e | එම | එම | එම | 0 | 0 | 26 | — |
| 4f | එම | එම | කැලේ | 0 | 2 | 30 | —* |
| 18 | ගල්කැටියාවෙලන්ද හෙවත් ගල්ලන්ද | එම | සිහින්කැලේ | 2 | 1 | 15 | —* |
| | | ඉල්ළුම්කාරයා—ලුනුගල ඇම්. ඒ. පීරිස් මහතා. | | | | | |
| 18a | එම | ආණ්ඩුව | තල්ගස් කීපයක් ඇති සිහින්කැලේ | 35 | 0 | 34 | 25 |
| | | මෙම ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | |
| 18b | ගල්කැටියාවෙලන්ද හෙවත් ගල්ලන්ද | ආණ්ඩුව | සිහින්කැලේ | 1 | 3 | 9 | —* |
| 18c | එම | එම | එම | 0 | 1 | 38 | —* |
| 18d | එම | එම | එම | 0 | 1 | 13 | —* |
| 18e | එම | එම | එම | 0 | 1 | 23 | —* |
| | | **අන්තිම සිතියම 16.** ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ හීන්නාරන්ගොල්ල. | | | | | |
| I 7e | අළුත්ගෙදරවත්ත | කේ. කිරිවන්තේ විසින් අල්ලාගන තිබේ | කුඹුර | 0 | 1 | 13 | 100 |
| I 7h | බෝගහවත්ත | බෝගහවත්තේ සියාතු විසින් අල්ලාගන තිබේ | කොස්ගස් 3ක් සහ කෙහෙල්ගස් 75 තිබේ | 0 | 0 | 21 | 200 |

* නොවිකුනා ආධාරයට තිබීම පිණිස.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| Q 7 | කහටගහඅරාවේහේන ආදිය | ආණ්ඩුව .. .. | සිහින්කැලේ .. | 1 | 1 | 16 | 45 |
| Q 7b | එම .. | එම .. .. | එම .. | 0 | 1 | 34 | —* |
| I 7f | මඩවලහේන .. | එම .. .. | හේන .. | 0 | 3 | 1 | 45 |
| I 7c | බෝගහවත්ත .. | බෝගහවත්තේ සියාතු විසින් අල්ලාගන තිබේ .. | කොස්ගස් එකක් සහ කෙහෙල්ගස 50ක් තිබේ | 0 | 2 | 38 | 60 |
| I 7g | කම්මල්වත්ත .. | වී. බද්දේරල විසින් අල්ලාගන තිබේ | උළුවහපු ගෙයක්ද, කොස් ගස් තුනක්ද, කිනගස් ගස් දෙකක්ද, දඹගස් දෙකක්ද, කෙහෙල් ගස් 75ක් සහ අක්කර කාලක පමණ තේ තිබේ .. | 2 | 2 | 0 | 100 |
| I 7d | අළුත්ගෙදරවත්ත .. | අළුත්ගෙදර අප්පු විසින් අල්ලාගන තිබේ | කෙහෙල්ගස් 80ද, කොස් ගස් එකක් සහ සපු ගහක්ද තිබේ .. | 3 | 2 | 21 | 50 |
| I 7 | මඩවලහේන ආදිය .. | ආණ්ඩුව .. .. | හේන .. | 5 | 0 | 31 | 45 |
| | සිතියම 1,857. ගම—උඩුකිඳ මහපලාතකෝරලේ හපුතලේ. ඉල්ළුම්කාරයා—බී. ජේ. විලී මහතා. | | | | | | |
| 1 | කඩවත්තේපතන හෙවත් කඩවත්තේකන්දේපතන | ආණ්ඩුව .. .. | පතන, ගල්සහිත ඉඩම | 6 | 3 | 18 | 50 |
| | අන්තිම සිතියම 32. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ කටුගහ. මෙම ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 9 | මිනුවන්උල්පොතේහේන .. | — .. .. | කෙහෙල්පඳුරු පහක් සහ පොඩි කොස්ගස් දෙකක් තිබේ .. | 0 | 1 | 31 | 50 |
| 9a | එම .. | ඇන්. ඇම්. උක්කුමැනිකා විසින් අල්ලාගන තිබේ .. | හේන .. | 0 | 0 | 4 | 50 |
| | ඉල්ළුම්කාරයා—කේ. හරමානිස් අප්පුහාමි. | | | | | | |
| 9b | එම .. | ආණ්ඩුව .. | පතන .. | 1 | 1 | 11 | 45 |
| | මෙම ඉම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 9c | මිනුවන්උල්පොතේහේන.. | ඇම්. මැනික්රල විසින් අල්ලාගන තිබේ | කොස්ගස් හයක්ද, ගුවලියාගස් තුනක්ද, කෙහෙල්ගස් 35ක්ද ඇති වත්ත .. | 0 | 1 | 23 | 50 |
| 9d | එම .. | ආණ්ඩුව .. .. | පතන .. | 0 | 0 | 5 | —* |
| 9e | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 3 | —* |
| 13a | ගල්බැදිගොඩපතන .. | ඇන්. ඇම්. උක්කු මැනිකා විසින් අල්ලාගන තිබේ .. | කෙහෙල්ගස් 14ක් ඇති හේන .. | 0 | 2 | 11 | 50 |
| | ඉල්ළුම්කාරයා—කේ. හර්මානිස් අප්පුහාමි. | | | | | | |
| 13b | එම .. | ආණ්ඩුව .. .. | පතන .. | 2 | 2 | 19 | 45 |
| | මෙම ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 13c | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 12 | —* |
| | අන්තිම සිතියමේ නොම්මරය. 108. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ මහවෙලගම. ඉල්ළුම්කාරයා—මහවෙල ඒ. සියාතු. | | | | | | |
| 87b | කොස්ගහඇල්ලේහේන හෙවත් ගලබොඩහේන .. | ආණ්ඩුව .. .. | හේන සහ සිහින්කැලේ | 2 | 0 | 32 | 45 |
| | මෙම ඉඩම්වලට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 87c | එම .. | එම .. .. | එම .. | 0 | 2 | 24 | —* |
| 87d | එම .. | එම .. .. | හේන .. | 0 | 3 | 3 | —* |
| 87e | මැදිරිය .. | එම .. .. | උල්පතක් ඇති සිහින් කැලේ .. | 1 | 3 | 18 | —* |
| | ඉල්ළුම්කාරයා—ජී. පුංචිරාල. | | | | | | |
| 136r | නෙල්ලිඅතුගොඩපතන.. | එම .. .. | කොස්ගහක් සහ දෙඩන් ගහක් ඇති පතන .. | 4 | 0 | 17 | 45 |
| | මෙම ඉඩමට ඉල්ළුම්කාරයෙක් නැහැ. | | | | | | |
| 136s | එම .. | එම .. .. | පතන .. | 0 | 3 | 26 | —* |

* නොවිකුණා ආධාරයට තිබීම පිණිස.

මේ ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 16වෙනි දින කොළඹ
මහලේකම්කාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්කාරිස් වර්‍ය.

---

**No. 1,187, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 4වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බදුදීමට යෝජනා කරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ වියළුව කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 1,835. ගම—වියළුවේ වියළුවකෝරලේ කිවුලේගෙදර. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | වෙලත්කැටියේහේන හෙවත් කොලොන්ගහහේන .. | ඇම්. දෙවයා ඇලේදුරයා .. | හේන .. | 4 | 1 | 13 | — |

බදු කොන්දේසි.

1. අවුරුද්දකට තක්සේරු මුදලෙන් වන රුපියල් 10 බැගින අවුරුදු 50කට ඉඩම බදු දෙනු ලැබේ. මෙම කාලය ඉකුත්වූවිට බද්ද අළුත්වැඩියා නොකරනු ලැබේ.

2. මෙම ඉඩම බදුදීම වෙන්දේසිකරනු ලැබේ. ඒ ඉඩම ගැණ තුන්මාසයක් දැනුම්දී එය ආපසු ආණ්ඩුවට ගැණීමේ බලය ආණ්ඩුවට පවරාගන්නවා ඇත.

3. බදු කාලය ඇතුලතදීත් ඉඩම තක්සේරකිරීමේදී බදු මුදල වෙනස්නොවේ.

4. බදු කාලය ඉකුත්වූවිට ඉඩමේ පිහිටි ගෙවල් පහ වැට්ලිවල වටිනාකම නොගෙවනු ලැබේ.

5. බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලිවීමකින් නොගෙන බද්ද වෙනකෙනෙකුට පත්කිරීමටවත්, බාරදීමට හෝ ලියාදීමටවත්, සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බැරිය.

6. කිසි කෙනෙකුගේ ප්‍රශ්නයක් නැතුව මෙම ඉඩම ඉතාමත් වැඩියෙන් ඉල්ලන මුදලට නොදී සිටීමේ බලය ආණ්ඩුවට පවරාගන්නවා ඇත.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 16වෙනි දින කොළඹ
මහලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාගේ වම්භ.

**No. 1,188, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 4වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර බදුදෙන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ කොඨාසයේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

සිතියම 1,518. ගම—උඩුකිඳ මහපලාත කෝරලේ බන්ඩාරවෙල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප |
|---|---|---|---|---|
| 8 | පන්වැවේපතන .. | බන්ඩාරවෙල ජේ. ඩී. ඇස්. ජයරත්න මහතා .. | පතන .. | 1 3 0·87 |

බදු කොන්දේසි.

(1) අවුරුද්දකට තක්සේරු මුදල වන රුපියල් 10 බැගින් අවුරුදු පනහකට ඉඩම බදුදෙනු ලැබේ. මෙම කාලය ඉකුත්වූවිට බද්ද අළුත්වැඩියා නොකරනු ලැබේ.

(2) බදුකාලය ඇතුළතදීත් ඉඩම තක්සේරු කිරීමේදී බදුමුදල වෙනස් නොවේ.

(3) බදුකාලය ඉකුත්වූවිට ඉඩමේ ගොඩනගනලද ගොඩනැගිලිවල වටිනාකම ගෙවන්නේ නැත.

(4) ඉඩම බදුදෙන්නේ රුපියල් 14,000කට අඩුනොවන මුදලකට පදිංචිය පිණිස ගෙයක් සහ ඊට ඕනෑකරණ පිට ගෙවල් සෑදීමට පමණිසි.

(5) මෙම බද්ද ලියාදුන් තුන්මාසයක් ඇතුළත ගොඩනැගීමට යෝජනාකරණ ගෙවල්වල පැලෑනද, දිග, පළල, උන් මට්ටම් සහ කොඨාසවල පැලෑනද පිටපත් දෙකක් බදුදෙන අය වෙත ඔප්පුකරන්ට ඕනෑය. එයින් එකක් ඒජන්ත උන්නාන්සේගේ කන්තෝරුවේ තබාගන්නවා ඇත. ඒ හැර ගෙවල් සාදන අන්දම, පාවිච්චිකරණ ද්‍රව්‍ය, ලී, යකඩ ගඩොල්, යනාදියේ සාමාන්‍ය නාම ලැයිස්තුවක්ද දෙන්ට ඕනෑය. මතුකී පැලෑනවල හෝ දිගින් පළලින් හෝ පාවිච්චිකරණ ද්‍රව්‍යවල හෝ වෙනසක් කරන්ට බදුදෙන අය කීවේනම් එසේ කරන්ටත් ඕනෑය.

(6) එසේ දෙනලද පැලෑන සහ මැනීම් යනාදියද පාවිච්චිකරණ ලීදඬු යනාදියේ ලැයිස්තුද ස්ථිරකළායින් පසු මාස දොළසක් ඇතුළත එසේ ස්ථිරකරණලද පැලෑන ලැයිස්තු යනාදියේ ප්‍රකාර සතුටුදායක අන්දමට සහ රුපියල් 14,000කට අඩුනොවන මුදලකට බදුකාරයාගේ වියදමෙන් ගෙවල් ගොඩනගන්ට ඕනෑය.

(7) මෙකී ගේ පදිංචි ගෙයක් හැඩයට මිස වෙන මොනම අන්දමේ කාරණවකටවත් බදුකාරයා විසින් පාවිච්චිකිරීමට හෝ ඔහු විසින් වෙන කෙනෙකුට පාවිච්චිකිරීමටවත් දීමට බලයක් නැත.

(8) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලිවීමකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත්, බාරදීමට හෝ ලියාදීමටවත්, සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බැරිය.

(9) කිසිකෙනෙකුගේ ප්‍රශ්නයක් නැතුව මෙම ඉඩම ඉතාමත් වැඩියෙන් ඉල්ලන මුදලට නොදීසිටීමේ බලය ආණ්ඩුවට පවරාගන්නවා ඇත.

මෙම ඉඩමේ බද්ද ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 16වෙනි දින කොළඹ
මහලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාගේ වම්භ.

**No. 1,189, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ මාර්තු මස 31වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරාදෙන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ බුත්තල, වැල්ලවාය, යටිකිඳ, බින්තැන්න, උඩුකිඳ සහ වෙල්ලස්ස කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 18ක්.

සිතියම 1,686. ගම—බුත්තල බුත්තලකෝරලේ පිල්ලේවෙල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මුදල, රු. |
|---|---|---|---|---|---|
| 702 | පිල්ලේවෙලකනත්ත .. | ඒ. කේ. කිරිවන්තේ .. | කැලේ .. .. | 0 1 16 | 20* |
| | සිතියම 1,691. ගම—බුත්තල බුත්තලකෝරලේ වගුරේවෙල. | | | | |
| 724 | වනේමන්කඩේකන්ඩියේ කැලේ .. | නාරන්වනේ අළුත්ගෙදර කිරි බන්ඩා .. | .. කැලේ .. .. | 1 3 15 | 50 |
| | සිතියම 1,511. ගම—වැල්ලවායේ කන්දපල්ලකෝරලේ කොස්ලන්ද. අයිතිකමකියන්නා—කොස්ලන්දේ හුදුහාමි. | | | | |
| K 161 | අඹගහකුඹුරේ වත්තේ හේන හෙවත් ඉරුවන් දන්පොලේ මුක්තෙට්ටු වේහේන .. | — | .. තේ සහ රබර් වවා තිබේ.. | 0 3 21 | 29† |
| | සිතියම 1,855. ගම—යටිකිඳ පසරකෝරලේ උල්පැන්අරව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | බෙරගහනකුඹුර .. | පස්සරගලේකුඹුරේ හුදුහාමි .. | කුඹුර .. . | 0 3 7 | 100 |

* මෙම බිම්කට්ටියේ දූවවල වටිනාකම වෙනුවට එය විකුණන දවසේ විකුණූ මුදලට රුපියල් සීයක් එකතුකරනු ලැබේ.

† මෙම බිම්කට්ටිය වර්ෂ 1910ක්වූ ජූනි මස 2 වෙනි දින සී. සී. බුරන්ච් මහතාට විකුනලා නො. 272,837 දරන ටයිටල් ප්ලෑන් පත්‍රය ඇති කුවුන් ගාන්ට් ඔප්පුව දීතිබේ. නුමුත් එම විකිනීම ආණ්ඩුවේ බලය පිට අහක්කර අයිතිවාසිකම් කියන අයට බේරාදීම පිණිස ප්‍රසිඩකළා ඇත.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| සිතියම 1,734. ගම—බින්තැන්නේඅරළුපිටියකෝරලේ රිදීමාලියද්ද. අයිතිකමකියන්නා—රිදීමාලියද්දේ පානා. මාරප්පන්. | | | | | | | |
| 0 22 | කොටුපොලවත්ත | ඞී. සී. කන්නන්ගර අප්පුහාමි | මාස අටක් වයස්වූ කෙහෙල් ගස් 5ක් සහ හරක් ගාලක් ඇති වත්ත | 1 | 1 | 36 | 50 |
| V 22 | එම | එම | අවුරුදු 5ක් වයස්වූ පොල් ගස් 8ක්ද, අවුරුද්දක් වයස්වූ පුවක්ගස් 1ක් සහ මාස 8ක් වයස්වූ කොහෙල් ගස් 18ක් ඇති වත්ත | 0 | 0 | 15 | —‡ |
| X 22 | එම | එම | අවුරුද්දක් වයස්වූ පුවක්ගස් 3ක්ද, අවුරුදු 5ක් වයස්වූ පොල්ගස් 20ද සහ මාස 8ක් වයස්වූ කෙහෙල්ගස් 15ද ඇති වත්ත | 0 | 2 | 1 | 100 |
| අන්තිම සිතියම 63. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ මීරහවත්ත. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | | |
| 37c | වැලිහෙලපතන | වෑගොල්ලේකඩේ ඒ. ඇම්. සියාතු | පතන | 2 | 3 | 28·75 | 40 |
| අන්තිම සිතියම 53. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ ඉඩමේගම. | | | | | | | |
| 2t | ගල්හේනෙපතන | ඉඩමේගෙදර වී. ඇම්. කිරිබන්ඩා සහ අඹගහකොටුවේගෙදර වී. ඇම්. සිරිබද්දන | පතන | 1 | 1 | 8 | 45 |
| සිතියම 1,704. ගම—වැල්ලවායේ කන්දපල්ලකෝරලේ කෙලිපානාවෙල. | | | | | | | |
| 799 | හපුගහලන්දේකැලේ | ඒ. ඇල්. කේ. රමුන්දෙනායකර් | කැලේ | 11 | 3 | 19 | 37·50 |
| අයිතිකමකියන්නා—එච්. ඒ. දඹවින්නේ මහතා. | | | | | | | |
| 799½ | එම | ඒ. ඇල්. කේ. රමුන්දෙනායකර් | කැලේ | 6 | 0 | 5 | 35 |
| අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | | |
| 800 | එම | — | කැලේ | 1 | 1 | 26 | —‡ |
| 801 | එම | — | එම | 0 | 3 | 13 | —‡ |
| ලංකාමැනීමේ සිතියම 283. ගම—වැල්ලවායේ වැල්ලවායකෝරලේ ගල්බොක්ක. | | | | | | | |
| 22 | මහපිටියේපතන | පී. ඞී. පී. කේරී මහතා | පතන | 47 | 0 | 35 | 50 |
| අන්තිම සිතියම 72. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ වැලිකඩ. | | | | | | | |
| 17 | හපුකනුවේවත්ත | බත්ගොඩවත්තේ ජේ. ජී. පෙරේරා | අවුරුදු 40ක් පමණ වයස්වූ කොස්ගස් 3ද, දෙඩන්ගස් 4ද, කොකටියගස් 3ද සහ අවුරුදු 25ක් පමන වයස් වූ කීනගස් 2ද තිබේ | 2 | 0 | 2 | 35 |
| 17a | එම | — | කොස්ගස් 2ක් සහ මූකලන් කීපයක් ඇති හේන | 0 | 2 | 3 | —‡ |
| අන්තිම සිතියම 53. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ ඉඩමේගම. | | | | | | | |
| 2r | ලිඳමුල්ලේගොඩ | දික්කා පියේ මුහන්දිරම්ගෙදර බද්දේරාල | හේන | 1 | 3 | 3 | 30§ |
| අන්තිම සිතියම 160. ගම—වෙල්ලස්සේ මැදගම්පත්තුවේ කලගහවක. අයිතිකමකියන්නා—කුඹුගල්පිටියේගෙදර බබෝරිස් විසින් අල්ලාගන තිබේ. | | | | | | | |
| 1a1 | කුඹුගල්පිටියේඅරාවේහේන | — | කුඹුර | 0 | 0 | 5 | 50 |

‡ නොවිකුණ ආධාරයට තිබීම පිණිස. § දෙවෙනි වතාවට ප්‍රසිඬකළා ඇත.

**මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.**

**වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 16වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.**

**ඒ. ඇස්. පැග්ඩන්, වැඩබලන මහලේකම්තාරිස් වම්හ.**

---

[Cancellation of Land Sale, P. of S. fixed for May 30, 1916.]

වර්ෂ 1916ක්වූ මැයි මස 30වෙනි දිනට නියමකරගණ තිබුන කෑගල්ල දිස්ත්‍රික්කුවේ ඉඩම් වෙන්දේසිය නවත්වන්ට යෙදුන බව මෙයින් දැනුන්දෙන්ට යෙදුනා ඇත.

වර්ෂ 1916ක්වූ පෙබරවාරි මස 15වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

සී. ජී. ජෝන්ස්, ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ.

---

**No. 3,583, S. O.—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 19වෙනි දිනවූ බදාදා දවල් 12ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ තිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ නවදුන්කෝරලේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.**

ලංකාමැනීමේ සිතියම 26.—කිරිබත්ගල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 6 | බුලත්වත්තේදෙනියඅස්වැද්දුම | කිරිබත්ගලගමගේ රත්රන්හාමි | කුඹුර | 0 | 1 | 20 |
| 26j | ගොඩැල්ලවත්ත | කුඩාවහුම්පුරගේ අදිරියා | වත්ත | 0 | 0 | 37 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 වනතුරුය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1916ක්වූ පෙබරවාරි මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්, වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

**No. 3,584, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 19වෙනි දිනවූ බදාදා දවල් 12ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කර දෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ බස්නාහිර නවදුන්කෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 82.—ඇත්බය.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 14*a* | මදිකනත්දේහේන .. .. | ආණ්ඩුව .. .. ... | හේන .. | 29 3 26 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 80ක් වේ.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වෙයර් ජනරාල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1916ක්වූ පෙබරවාරි මස 23වෙනි දින කොළඹ මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාරිස් වමිහ.

---

**No. 3,585, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 19වෙනි දිනවූ බදාදා දවල් 12ට රත්නපුරේ කච්චේරියේදි වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ නවදුන් කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ සිතියම 84.—හන්ගොමුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 24 | කුඹුවෙලකැලේ, කෙහෙල්වත්දෙනි යේහේන, පනාපිටියාලායේහේන සහ තවත් .. .. | ආණ්ඩුව, වනසුන්දරමුහම්දිරමලායේ පුනචිමහත් මයා විසින් ඉල්ළුම්කර තිබේ .. | හේන .. | 6 0 16 |
| 24*j* | ගනිතයාලායේහේන .. | එම .. .. | එම .. | 1 0 6 |
| 24*l* | මානවත්තයාලායේහේන .. | ආණ්ඩුව, වක්කුඹුරගේ රත්රන්හාමි විසින් ඉල් ළුම්කර තිබේ .. .. | එම .. | 0 0 17 |
| 25*c* | කුඹුවෙලකැලේ, තැන්නේහේන, මානවත්තයාලායේහේන .. | එම .. .. | එම .. | 10 3 37 |
| 47*h* | පරගහගොඩවත්තේහේන .. | එම .. .. | එම .. | 1 0 7 |
| 47*n* | අරිද්දමන්ඩිය .. | ආණ්ඩුව, කොස්ගොඩගේ පෝසත්හාමි විසින් ඉල්ළුම්කර තිබේ .. .. | මුකලාන .. | 3 1 7 |
| 47*q* | කහටගහහේන සහ හතරහව්ලේ හේන .. .. | එම .. .. | එම .. | 6 0 22 |
| 52*a* | හීන්පදුරේහේන සහ ලිඳගාව්හේන | එම .. .. | හේන .. | 0 2 36 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 වනතුරුය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරී මස 23වෙනි දින කොළඹ මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාරිස් වමිහ.

---

**No. 3,586, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1916ක්වූ අප්‍රේල් මස 11වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට පැල්මඩුල්ලේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ නවදුන් කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ සිතියම 17.—දිප්පිටිගල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අළුත්ගෙදරවත්ත .. .. .. | ආණ්ඩුව .. | වත්ත .. | 7 1 32 |
| 3 | කෝන්ගහදෙනිය, දොරකඩදෙනිය, පිංකුඹුර, ගන්ඉමේදෙනිය .. | එම .. | කුඹුර .. | 5 1 2 |
| 6 | පොල්වත්ත, අම්බලන් ගොඩැල්ලවත්ත, පුස්සේහේන, පේදුරුගේ වත්ත .. .. .. | එම .. | වත්ත .. | 5 2 35 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 75ක් වේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරී මස 23වෙනි දින කොළඹ මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාරිස් වමිහ.

---

# LAND ACQUISITION NOTICES.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

[Wewala, Colombo District.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වැවල පිරිමි සහ ගැණු ලමයින්ට සෙකොලයක් සාදන පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරකමන්ත්‍රීසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 16,183. ගම—වැවල. අයිතිකමකියන්නා—ඩී. ඇස්. ඩබ්ලිව්. සමරකෝන්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | දෙල්ගහ නොහොත් ගල්පොත වත්ත .. | පොල් සහ රබර් ඉඩමක්, එක පැලක්ද, අඹගස් 2ක්ද, කොස්ගස් 3ක්ද, රබර් ගස් 180ක්ද, පොල්ගස් 34ක්ද, පොල්පැල 77ක්ද, (ආණ්ඩුව විසින් සාදවාපු ලිදක්සහ සෙකොලයක්) සහ පිට ගෙයක්ද තිබේ .. .. | 1 1 6·75 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|
| | | අයිතිකමකියන්නා—වැවල පදිංචි ජී. ඉසබලා සිල්වා. | |
| 2 | දෙල්ගහවත්ත .. | පොල්ගස් 92ක්ද, කොස්ගස් 13ක්ද, අඹගස් 4ක්ද, ගොඩපොරගහක්ද, (ආණ්ඩුව විසින් සාදවාපු ලිදක් සහ සෙකෝලයක්ද) ඇති ඉඩමක් .. | 1 0 11 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1916ක්වූ මාර්තු මස 20වෙනි දින පෙරවරු 11ට කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 21වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

එච්. ඕ. ෆේපාක්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

[Uyana, (Lunawa) Colombo Distirict.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ටේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මොරටුවේ ආරෝග්‍ය ශාලාවේ ඉඩම් දීර්ඝකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 15,812. ගම—උයන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| I 55 | මාදන්ගහවත්ත .. | අවුරුදු 30ක් පමණ වයස ඇති පොල්ගස් 34ක් .. | හැරි සොයිසා .. | 0 1 21·87 |
| | | සිතියම 16,185. ගම—උයන. | | |
| 1 | එම .. | අවුරුදු 30ක් පමණ වයස ඇති පොල්ගස් 15ක් .. | එම .. | 0 0 19·50 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1916ක්වූ මාර්තු මස 21වෙනි දින පෙරවරු 11.15ටේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1916ක්වූ පෙබරවාරි මස 21වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

එච්. ඕ. ෆේපාක්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ

---

[Kosgama, Colombo District.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ටේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කොස්ගම ගැණු සෙකෝලය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 16,184. ගම—කොස්ගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පොලබෝවවත්ත .. | අවුරුදු 30ක් වයස ඇති පොල් ගස් 8ක් තිබෙන වත්තක් .. | මූනසිංහආරච්චිගේ කැරලින් සහ නල ගලගේ දොන් හෙන්ද්‍රික්අප්පු .. | 0 0 13·87 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1916ක්වූ මාර්තු මස 21වෙනි දින පෙරවරු 11ටේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 21වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

එච්. ඕ. ෆේපාක්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

[Negombo.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ටේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ප්‍රසිද්ධ වැසිකිළියකට සහ ඊට පාරක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 16,188. ගම—මීගමුව.

| නො. | ඉඩමේනම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අත්තික්කගහවත්ත .. | පොල්ගස් 17ක් සහ දෙහිපැලයක් තිබේ | ඇම්. නාගලින්ගම් .. | 0 0 11·34 |
| 2 | එම .. | පොල්ගස් 15ක් තිබේ .. | එම .. | 0 0 8·10 |
| 3 | එම .. | හිස්බිම .. .. | රොසමරියා ප්‍රනාන්දු .. | 0 0 0·43 |
| 4 | එම .. | පොල්ගහක් තිබේ .. .. | පීටර් පෙරේරා .. | 0 0 1·6 |
| 5 | එම .. | පොල්ගස් 2ක් තිබේ .. .. | සුන්දරඅම්මා .. | 0 0 5·6 |
| 6 | එම .. | හිස්බිම .. .. | එම .. | 0 0 0·37 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1916ක්වූ මාර්තු මස 22වෙනි දින උදේ 11ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1916ක්වූ පෙබ්‍රවාරි මස 21වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

එච්. ඕ. ලේපාක්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

[Alawatugoda, Kandy District.]

